WWW.OLEVELAPI.COM

OL/2019/15/S-I, II

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

| | |
|---|---|
| ක්‍රිස්තියානි ධර්මය | I, II |
| கிறிஸ்தவம் | I, II |
| Christianity | I, II |

2019.12.02 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ක්‍රිස්තියානි ධර්මය I

**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ක්‍රිස්තු උපත වැදගත් සිදුවීමක් ලෙස සැලකෙන්නේ,
(1) බලාපොරොත්තු වූ අන්දමට සිදු වූ නිසා ය.
(2) ජනතාව ඉදිරියේ සිදු වූ නිසා ය.
(3) දිවැස් වැකි සම්පූර්ණ වූ නිසා ය.
(4) බොහෝ කලකට පෙර සිදු වූ නිසා ය.

**2.** දිවැසිවරුන්ගෙන් හා පසුව දේව දූතයන්ගෙන් මරියතුමිට දුන් පණිවුඩය වූයේ ජේසුස් වහන්සේගේ,
(1) ශ්‍රේෂ්ඨත්වය පිළිබඳවයි.
(2) රූප ලක්ෂණ පිළිබඳවයි.
(3) දුගී බව පිළිබඳවයි.
(4) තරාතිරම පිළිබඳවයි.

**3.** දිවැසිවරු පැවසූ ආකාරයට ජේසුස් වහන්සේ සිය මෙහෙවර තුළින් අපට අභියෝග කරන්නේ,
(1) සේවය ලබන අතර අන් අයට සේවය කිරීමට ය.
(2) සේවය ලබන්නට නොව සේවය කිරීමට ය.
(3) සේවයේ නියම අරුත අන් අයට කියාදීමට ය.
(4) සේවය කරන අතර එහි සීමාවන් තේරුම් ගැනීමට ය.

**4.** පේදුරු, තෝමස් සහ මතෙව් යන තිදෙනාටම පොදු ලක්ෂණයක් නම්,
(1) ඔවුන් ධීවරයන් වීමයි.
(2) ජේසුස් වහන්සේ සමග ගෙත්සෙමන උයනේ සිටීමයි.
(3) ජේසුස් වහන්සේ අත්වෙසක් වීමේ දී සිටීමයි.
(4) ජේසුස් වහන්සේගේ ප්‍රේරිතයන් වීමයි.

**5.** පේදුරුගේ මහා ප්‍රකාශය කුමක් ද?
(1) "ඔබ දෙවියන් වහන්සේගේ දිවැසිවරයාණෝ ය."
(2) "ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය."
(3) "ඔබ සමග මරණයට යෑමට වුව ද සූදානම් ය."
(4) "ඔබගේ වචන ලොව සීමා දක්වා ගෙන යමි."

**6.** කෙනෙකු තමා ගැන අධිතක්සේරු කරගැනීමේ අවදානම දක්වන උපමාව වන්නේ,
(1) පරිසිවරයා සහ අයකැමියා ය.
(2) ධනපතියා සහ ලාසරස් ය.
(3) යුද්ධයට යන රජකෙනෙකුගේ පෙර සූදානම ය.
(4) පොහොසත් මෝඩයා ගැන ය.

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

7. ස්නාවක ජොහාන්තුමාගේ සේවය පිළිබඳ පහත ප්‍රකාශ සලකා බලන්න.
   A - "සැබැවින්ම යුක්තිය ඉටුකරන්නේ ය."
   B - "මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි."
   C - "එතුමාණෝ ඉසුළුවේ අපේ දුක ය."
   D - "වනාන්තරයේ සමිඳුන් හට මාවතක් සදන්න."

   ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මලාකි හා යෙසායා දිවැසිවරු ස්නාවක ජොහාන් ගැන සඳහන් කරන ප්‍රකාශ මොනවා ද?

   (1) A, B    (2) A, C    (3) B, C    (4) B, D

8. ජුදෙව්වන්ගේ සිත් තුළ තිබූ බලාපොරොත්තුව ඉෂ්ට කරගැනීම සඳහා ජේසුස් වහන්සේ වෙතට යොමු කළ පුද්ගලයා කවුරුන් ද?

   (1) ජොහාන්    (2) පේදුරු    (3) ස්නාවක ජොහාන්    (4) සෙකරියස්

9. ජේසුස් වහන්සේ පිළිබඳ සුභාරංචිය ගෙන ආ දේවදූත පණිවුඩය දැනුම් දුන්නේ,
   (1) සෙකරියස්, මරිය තුමී හා එඬේරුන්ට ය.
   (2) සෙකරියස්, එළිසබෙත් හා ජෝසප්තුමාට ය.
   (3) සෙකරියස්, ජෝසප්තුමා හා සිමියොන්ට ය.
   (4) සෙකරියස්, සිමියොන් හා අන්නාට ය.

10. ජේසුස් දරුවා දේව මාලිගයට ගෙන ගිය සිද්ධියෙන් අපට උගත හැකි වැදගත් පාඩම වන්නේ,
   (1) දෙමාපියන් සමග පමණක් දේවස්ථානයට යා යුතු බව ය.
   (2) දෙවියන් වහන්සේට මුල්තැන දීමට දේවස්ථානයට යෑම වැදගත් බව ය.
   (3) වත් පිළිවෙත් තුළින් කිතුනු අනන්‍යතාවය තහවුරු කරගැනීම ය.
   (4) කිතුනුවන් ශ්‍රී ලාංකික අනන්‍යතාවය ඇතිව ජීවත් වීම ය.

11. පහත ප්‍රකාශ අතුරෙන් ස්නාවක ජොහාන්ගේ සේවය වත්මන් කිතුනුවන්ට වඩාත් වැදගත් යැයි පෙන්නුම් කෙරෙන ප්‍රකාශ මොනවා ද?
   A - අප සතු දේ බෙදාගැනීම වැදගත් බව පිළිගැන්වීම
   B - ජේසුස් වහන්සේට එතුමාගේ සේවය ගැන කියා දීම
   C - යහපත ඉටුකිරීමෙන් සමාජයක් ගොඩනැගීමේ හැකියාව තේරුම් කිරීම
   D - ජනතාව තමා වෙත යොමු කර ගැනීම

   (1) A, B    (2) A, C    (3) B, C    (4) C, D

12. පාසල් ශිෂ්‍යයෙක් ලෙස ඔබට ස්නාවක ජොහාන්තුමාගෙන් ලැබෙන අභියෝගය කුමක් ද?

   (1) මනස්තාපනය    (2) කමාවදීම    (3) ඉවසීම    (4) ප්‍රේමය දැක්වීම

13. හෙරොද් රජු විසින් ස්නාවක ජොහාන්ව ප්‍රතික්ෂේප කරනු ලැබුවේ,
   (1) හෙරොද්ගේ නීති රීති තද වැඩිකම ප්‍රකාශ කළ නිසා ය.
   (2) හෙරොද් අසාධාරණ ලෙස මුදල් පරිහරණය කිරීම හෙළා දැකීම නිසා ය.
   (3) රෝම අධිරාජ්‍යයා සමග හෙරොද් පැවැත් වූ සම්බන්ධතා ගැන විරෝධය පළ කළ නිසා ය.
   (4) හෙරොද්ගේ දුෂ්ටකම ගැන ප්‍රකාශ කළ නිසා ය.

W W W . O L E V E L A P I . C O M

14. ජේසුස් වහන්සේ ඉපදුනු හා හැදුනු වැඩුනු නගර පිළිවෙළින්,
   (1) ජෙරුසලම හා නාසරෙත් ය.
   (2) ජෙරුසලම හා කානන් ය.
   (3) බෙත්ලෙහෙම හා කානන් ය.
   (4) බෙත්ලෙහෙම හා නාසරෙත් ය.

15. ජේසුස් වහන්සේගේ සිනගෝගයේ ප්‍රථම දේශනයේ තේමා පාඨය කුමක් ද?
   (1) 'ජුදෙව් ජනතාවට දේව රාජ්‍යය සතු ය.'
   (2) 'අන්‍ය ජාතීන්ට ද දේව රාජ්‍යය විවෘත ය.'
   (3) 'තෝරා ගත් අයට දේව රාජ්‍යය අයත් ය.'
   (4) 'දේව රාජ්‍යයට ගෞරවය හිමි වේ ය.'

16. ස්නාවක ජොහාන් හා ජේසුස් වහන්සේ සොයා ආ අයට ඔවුන් හඳුනා ගැනීම සඳහා දුන් සලකුණු වන්නේ,
   (1) පාළුකරයේ හඬ සහ ඔටු ලෝම වස්ත්‍ර ය.
   (2) ගව ඔරුවක බා සිටි බිළිඳා සහ තරුව ය.
   (3) පාළුකරයේ හඬ හා ගව ඔරුවක බා සිටි බිළිඳා ය.
   (4) ගව ඔරුවක බා සිටි බිළිඳා සහ දේවදූත සේනාව ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

17. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ස්නාවක ජොහාන් හා ජේසුස් වහන්සේගෙන් අප ලබන වඩාත් වැදගත් ජීවිත ආදර්ශය කුමක් ද?
(1) විශේෂ දේව සලකුණක් ලැබෙන තෙක් බලා සිටීම
(2) කටුක දිවිපෙවෙතක් ගත කිරීම සඳහා සූදානම්ව සිටීම
(3) දෙවියන් වහන්සේගේ ආලේපය ලැබෙන තෙක් බලා සිටීම
(4) කටුක දිවිපෙවෙතක් ගත කිරීම ගැන මෙනෙහි නොකිරීම

18. සිමියොන් සහ අන්නා ජේසුස් වහන්සේ ගැන කළ පොදු ප්‍රකාශය කුමක් ද?
(1) මෙසියස් වහන්සේ ගෙනෙන ලද ගැලවීම.
(2) ඊශ්‍රායල් ජනයාගේ මහිමය.
(3) මෙසියස් වහන්සේ පිළිනොගන්නා අයගේ වැටීම.
(4) ජේසුස් වහන්සේ අනාගතයේ සිදුකරන දිවි පිදීම.

19. ජේසුස් වහන්සේ සිනයෝගයේ කරන ලද ප්‍රථම දේශනයේ සංක්ෂිප්ත ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - දිළිඳුන්ට සුභාරංචිය දේශනා කිරීම
B - ධනවතුන්ට ලැබෙන ආශිර්වාද
C - බලවතුන්ට අධිකාරිත්වය
D - පීඩිතවූවන්ට මිදීම
ඉහත දී ඇති ප්‍රකාශ අතුරෙන් දේව රාජ්‍යයේ ලකුණු පමණක් දැක්වෙන ප්‍රකාශ මොනවා ද?
(1) A, B (2) A, C (3) A, D (4) B, C

20. 'දියඹට ගොස් දැල් හෙලන්න' යැයි ජේසුස් වහන්සේ පැවසුවේ,
(1) සීමොන්ට ය. (2) ජාකොබ්ට ය. (3) ජොහාන්ට ය. (4) අන්ද්‍රෑට ය.

21. ගෝලයන් කැඳවීමේ සිද්ධියෙන් ජේසුස් වහන්සේ අපට ඉදිරිපත් කරන පාඩම වන්නේ,
(1) කැඳවීමට ප්‍රථම අප එය තෝරාගත යුතු බව ය.
(2) සේවය අගය කොට අන් අයට දැන්වීම ය.
(3) ජේසුස් වහන්සේගේ සේවයේ පංගුකාරයන් විය යුතු බව ය.
(4) ජේසුස් වහන්සේගේ සේවයට කවුරුන් හෝ ඉදිරිපත් කළ යුතු බව ය.

22. පරිසිවර සීමොන්, මාර්තා හා මරියා සහ සාකෙවුස්ගේ නිවසට ගිය ජේසුස් වහන්සේ ආගන්තුක සත්කාරය ගැන අපට උගන්වන්නේ,
(1) විවිධ අයගේ නිවෙස්වලට යා යුතු බව ය.
(2) තරාතිරම් නොබලා සබඳතාවයන් ඇති කිරීම වැදගත් බව ය.
(3) ආරාධනයක් නොලද වුව ද නිවෙස්වලට යා යුතු බව ය.
(4) නිවසකට පිවිසුන විට චාරිත්‍රානුකූලව ක්‍රියා කළ යුතු බව ය.

23. ජේසුස් වහන්සේ ළමුන් හා කාන්තාවන් පිළිගැනීම තුළින්,
(1) ඔවුන්ට වටිනාකමක් ලබා දුන්නේ ය.
(2) අන් අයට වඩා ඉහළින් ඔවුන් ඔසවනු ලැබී ය.
(3) ඔවුන් බලාපොරොත්තු නොවූ අන්දමට ජනප්‍රියත්වයක් ලැබී ය.
(4) ඔවුහු අන් අයට තමා ගැන ප්‍රකාශ කිරීමට යොදා ගත්හ.

24. පර්සිවරු හා සද්දුසිවරු ජේසුස් වහන්සේ මුණගැසුණේ කුමක් සඳහා ද?
(1) රහසිගත සාකච්ඡා පැවැත්වීමට
(2) ඔවුන්ගේ ප්‍රශ්නවලට දේව මඟපෙන්වීම ලබා ගැනීමට
(3) ජේසුස් වහන්සේට අභියෝග එල්ල කිරීමට
(4) ජේසුස් වහන්සේට සත්‍යය ගැඹුරින් තේරුම් කර දීමට

25. කමා නොවූ දාසයා පිළිබඳ උපමාවෙන් ජේසුස් වහන්සේ අපට අභියෝග කරන්නේ,
(1) කමාව දීමට නිතර පෙළඹිය යුතු බවයි.
(2) තමාට නිතර කමාව ලබා ගැනීමට ක්‍රියා කළ යුතු බවයි.
(3) කමාව ලැබීමට කමාව දානය කළ යුතු බවයි.
(4) සිය මිතුරන්ට කමාවීමට පසුබට නොවිය යුතු බවයි.

[හතරවැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

26. 'සාමය ඇතිකරන්නෝ භාග්‍ය වන්තයෝ ය.' මේ කියමනට අනුකූලව සමාජයේ සාමය ස්ථාපනය කිරීම සඳහා මනුෂ්‍යයා,
   (1) සාමකාමී පුරවැසියකු වීමෙන් සෑහීමට පත්විය යුතු ය.
   (2) යුක්තිය හා සාධාරණත්වය ස්ථාපනය කළ යුතු ය.
   (3) යුද්ධයෙන් තොර සමාජයක් ගොඩනැගීමට මුල් තැන දිය යුතු ය.
   (4) අවශ්‍ය වූ විට බලහත්කාරයෙන් සාමය ගෙන ඒමට ක්‍රියා කළ යුතු ය.

27. ජුදෙව් නීතිය ඉහළින් තබා ක්‍රියාකරමින් ඔවුන් ගැන උදම් ඇණූ අයට ජේසුස් වහන්සේගේ ප්‍රතිචාරය වූයේ කුමක් ද?
   (1) ඔවුන්ව දේව මාලිගයේ දී සුළු කොට සැලකීම
   (2) ඔවුන්ව ප්‍රතික්ෂේප කිරීම
   (3) ඔවුන්ව නාඳුනන බව පෙන්වීම
   (4) දෙවිඳුන් ඉදිරියේ ඔවුන් ප්‍රතික්ෂේප විය හැකි බව පෙන්වීම

28. නායක පූජකවරයකු පත් කරනු ලැබුවේ කුමන කණ්ඩායමක් අතුරෙන් ද?
   (1) පරිසි කණ්ඩායමෙන්
   (2) විනයධරයන්ගෙන්
   (3) සද්දුසිවරුන්ගෙන්
   (4) ලෙවිවරුන්ගෙන්

29. සබත් නීතියට අනුව ජේසුස් වහන්සේ ඉගැන්වූයේ,
   (1) නීතියට අනුකූලව ක්‍රියාකිරීම වැදගත් බව පෙන්වීමට ය.
   (2) නීතිය වැදගත් වන්නේ එය දෙවියන් වහන්සේගෙන් නිසා ය.
   (3) නීතිය පදනම් වී ඇත්තේ මිනිසාට ඇති ප්‍රේමය සහ දයානුකම්පාව මත ය.
   (4) කුමක් සිදු වුව ද නීතිය අනුගමනය කිරීම සියලු දෙනාගේ වගකීමක් බව ය.

30. ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ.
   A - ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් දේව බලය අත්දැකීම
   B - දේව රාජ්‍යයේ අවශ්‍යතා ඇති අයට පමණක් දයානුකම්පා වීම
   C - යක්ෂයාගේ බලය ක්‍රියාත්මක වන බව ඒත්තු ගැන්වීම
   D - ජීවිත කුණාටු ජය ගැනීමට දේව බලය වැදගත් බව දැන්වීම
   ඉහත අදහස් අතුරෙන් දේව රාජ්‍යය පිළිබඳ අදහස් මොනවා ද?
   (1) A, B (2) A, C (3) A, D (4) B, D

31. අපේක්ෂිත මෙසියස් තුමාගේ විශේෂ ලක්ෂණයක් වූයේ,
   (1) නාසරෙත්හී ඇති දැඩි වීම ය.
   (2) එතුමා ජුදෙව්වන්ගේ රජ වීම ය.
   (3) කුරුසියේ දිවි පිදිය යුතු වීම ය.
   (4) සාමයේ කුමාරයාණෝ වීම ය.

32. බැටළු එඬේරකුගේ චරිත ලක්ෂණ පහත දැක්වේ.
   A - බැටළුවන් පෝෂණය කිරීම හා මඟපෙන්වීම
   B - සතුරන් පැමිණි විට සිය ජීවිතය රැකගැනීම
   C - බැටළුවන්ට ආරක්ෂාව දීම හා තම ජීවිතය ඔවුන් උදෙසා කැප කිරීම
   D - බැටළු ලොම්වලින් ප්‍රයෝජන ගැනීම හා රළු දිය පහර මැදින් ගෙනයෑම
   ඉහත සඳහන් චරිත ලක්ෂණ අතුරෙන් යහපත් බැටළු එඬේරකු වශයෙන් ජේසුස් වහන්සේ විදහා පෑ ලක්ෂණ මොනවා ද?
   (1) A, B (2) A, C (3) B, C (4) B, D

33. "මාගේ පාපවලින් මා පිවිතුරු කළ මැනව" යන ප්‍රකාශයේ යැදුම ඉදිරිපත් කළේ කවුරුන් ද?
   (1) යෙසායා දිවැසිවරයා
   (2) ආමොස් දිවැසිවරයා
   (3) දාවිත් රජතුමා
   (4) අපොස්තුළු පාවුල් තුමා

34. වත්මන් කිතුනුවන් දිළිඳුභාවය ගැන දැරිය යුතු ආකල්පය නම්,
   (1) දිළිඳු බව නිත්‍ය වශයෙන් සමාජයේ පවතින්නක් බව පිළිගැනීමයි.
   (2) දිළිඳු බව සතුටින් පිළිගැනීමට දුප්පතුන් දිරිගැන්වීමයි.
   (3) දුගී අයට දන්දීමෙන් ඔවුන් සතුටු කිරීමයි.
   (4) දිළිඳු තත්ත්වයෙන් ගොඩ ඒමට උදව්වෙමින් ඔවුන් දිරිගැන්වීමයි.

[පස්වැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**35.** සාමයට සහ සමාජ සේවයට මෑත කාලයේ දී අප රට තුළ කැප වී ක්‍රියා කළ දෙදෙනෙක් නම්,
(1) මයිකල් රොඩ්රිගෝ පියතුමා සහ ජෙරාඩ් ද සිල්වා පියතුමා ය.
(2) චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා සහ තිස්ස බාලසූරිය පියතුමා ය.
(3) චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා සහ ජෙරාඩ් ද සිල්වා පියතුමා ය.
(4) තිස්ස බාලසූරිය පියතුමා සහ මයිකල් රොඩ්රිගෝ පියතුමා ය.

**36.** එපීසයේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වලින් බැඳී සිටි ජනතාවගේ ක්‍රියාවන් කිහිපයක් පහත දැක්වේ.
A - ඔවුන්ගේ ගුරුකම් ලැයිස්තුවට ජේසුස් වහන්සේගේ භාෂකම් ඇතුල් කිරීම
B - ගුරුකම් ඇතුළත් සියලු පොත්පත් පුළුස්සා දැමීම
C - ගුරුකම් ඇතුළත් පොත් විකුණා පාවුල්ට මුදල් දීම
D - ජේසුස් වහන්සේ පිළිගෙන, ගුරුකම් පසෙකලා, දෙවියන් වහන්සේට සාක්ෂි දැරීම
ඉහත ඒවා අතුරෙන් පාවුල්ගේ ධර්මදූත සේවයෙන් පසු එපීසවැසියන්ගේ ක්‍රියාමාර්ග වූයේ මොනවා ද?
(1) A, B (2) A, D (3) B, C (4) B, D

**37.** නව ජීවිතයකට පිවිසීම සඳහා අභ්‍යන්තර වෙනසක අවශ්‍යතාවය ජේසුස් වහන්සේ දැක්වූ අවස්ථාවක් වන්නේ,
(1) සමාරිත ස්ත්‍රිය සමග කෙරුණ සංවාදයේ දී ය.
(2) නිකදේමුස්ගේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ය.
(3) සීමොන් පරිසිවරයාගේ ක්‍රියා කලාපය හෙළා දුටු අවස්ථාවේ දී ය.
(4) මාර්තාට එම නිවසේ දී අභියෝග කළ අවස්ථාවේ දී ය.

**38.** යෙසායා දිවැසිවරයා විසින් දුක් විඳින සේවකයානන් ලෙස ජේසුස් වහන්සේ හඳුන්වා දීමට හේතු වූ විශේෂ ලක්ෂණයක් **නොවන්නේ** කුමක් ද?
(1) පව් කමා කරන පූජාවේ මරණයකි.
(2) පව්කරුවන් වෙනුවෙන් මැදහත්කාරකම් කරන්නෙකි.
(3) අපේ දුක හා වේදනාව දරන්නෙකි.
(4) කලකිරීමට හා අධෛර්යට පත්වීමකි.

**39.** කිතුනු මෙහෙවරයේ දී කුරිරු ප්‍රහාරයට මුහුණ දීමට සිදුවුව ද වරදකරුවන්ට සමාව දානය කළේ කවුරුන් ද?
(1) ගරු ජෙරාඩ් ද සිල්වා සහ දෙවන ජුවාම් පාවුල් තුමා
(2) දෙවන ජුවාම් පාවුල් තුමා සහ චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා
(3) ගරු ජෙරාඩ් ද සිල්වා සහ චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා
(4) චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැති තුමා සහ තිස්ස බාලසූරිය පියතුමා

**40.** කිතුනු පවුලක් වශයෙන් සමාජය කෙරෙහි අපේ යුතුකම විය යුත්තේ,
(1) වෙනත් කිතුනු පවුල් සොයාබලා ඔවුනට අතහිත දීම ය.
(2) සියල්ල ඉවසමින්, කමාවෙමින් දේව ගෞරවය සඳහා ක්‍රියා කිරීම ය.
(3) දේව වචනය සමාජය තුළ පතළ කිරීමට යුහුසුළු වීම ය.
(4) සමාජයේ අඩුපාඩු හෙළාදැක නිසි මඟ කියා දීම ය.

WWW.OLEVELAPI.COM

* *



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...